උප ලේඛණය V

1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනත මගින් දක්වා ඇති නිල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ සාමදාන විනිශ්චයකාරවරුන්

I. අග්‍ර විනිශ්චයකාරවරයා
II. පාර්ලිමේන්තු විපක්ෂයේ නායකවරයා
III. ශ්‍රේෂ්ඨාධිකරයේ විනිශ්චයකාරවරුන්
IV. අභියාචනාධිකරණයේ සභාපතිවරයා
V. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්
VI. නියෝජ්‍ය කතානායකවරයා
VII. නියෝජ්‍ය අමාත්‍යවරුන්
VIII. නියෝජ්‍ය කාරක සභාපතිවරයා
IX. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්
X. නීතිපතිවරයා
XI. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා
XII. ජනාධිපතිවරයාගේ ලේකම්වරයා
XIII. අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා
XIV. පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා
XV. විවිධ අමාත්‍යාංශවල ලේකම්වරුන්
XVI. මහාධිකරණයේ විනිශ්චයකාරවරුන්
XVII. පොලිස්පතිවරයා
XVIII. සොලිසිටර් ජෙනරල්වරයා
XIX. විවිධ අමාත්‍යාංශවල අතිරේක ලේකම්වරුන්
XX. නීති කෙටුම්පත් සම්පාදක
XXI. අල්ලස් කොමසාරිස්වරයා
XXII. අතිරේක සොලිසිටර් ජෙනරල්වරයා
XXIII. අතිරේක නීති කෙටුම්පත් සම්පාදක
XXIV. මහා භාරකාරවරයා
XXV. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා
XXVI. නියෝජ්‍ය සොලිසිටර් ජෙනරල්වරුන්
XXVII. විවිධ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්
XXVIII. පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්වරයා
XXIX. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා
XXX. අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා
XXXI. නියෝජ්‍ය පොලිස්පතිවරුන්
XXXII. ජ්‍යෙෂ්ඨ රජයේ නීතිපතිවරුන්
XXXIII. රජයේ නීතිඥවරුන් හා විවිධ අමාත්‍යාංශවල සහකාර ලේකම්වරුන්
XXXIV. ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා;
XXXV. අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා

XXXVI. පොලිස් අධිකාරිවරුන් සහ ආධුනික සහකාර පොලිස් අධිකාරීවරුන් නොවන සහකාර පොලිස් අධිකාරිවරුන්

XXXVII. මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයා

XXXVIII. පාර්ලිමේන්තුවේ සභානායකවරයාගේ ලේකම්වරයා

XXXIX. පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ ලේකම්වරයා

XL. කම්කරු විනිශ්චය සභා ලේකම්වරයා

උප ලේඛණය VI

නිල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ කොටස් සඳහා සාමදාන විනිශ්චයකාරවරුන්

I. දිසා අධිකරණයේ විනිශ්චයකාරවරුන්, පවුල් අධිකරණ විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරුන්, කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්, තම අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශය සඳහා ද,

II. දිසා අධිකරණයන් හි අධිකරණ බල සීමා තුළ කටයුතු කරන කාතිවරුන් ඒ දිස්ත්‍රික්ක සඳහා ද,

III. දිසා අධිකරණයන් හි අධිකරණ බල සීමා තුළ පදිංචිව සිටින කාති මණ්ඩලවල සාමාජිකයන් ඔවුන් පදිංචිව සිටින ඒ දිස්ත්‍රික්ක සඳහා ද,

IV. මහාධිකරණයේ අතිරේක රෙජිස්ට්‍රාර්වරුන් එකී අධිකරණ බල සීමා සඳහා ද,

V. දිසා අධිකරණවල, පවුල් අධිකරණවල, මහේස්ත්‍රාත් අධිකරණවල, ප්‍රාථමික අධිකරණවල රෙජිස්ට්‍රාර්වරුන් සහ කම්කරු විනිශ්චය සභාවල සහකාර ලේකම්වරුන් ඒ ඒ අධිකරණවල හෝ කම්කරු විනිශ්චය අධිකාරිවල අධිකරණ බලසීමාව සඳහා ද,

VI. දිස්ත්‍රික් ලේකම්වරුන් තම තමන් සේවය කරන පරිපාලන දිස්ත්‍රික්ක සඳහා ද,

VII. අතිරේක දිස්ත්‍රික් ලේකම්වරුන් තම තමන් සේවය කරන ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්ක සඳහා ද,

VIII. ප්‍රාදේශීය ලේකම්වරුන් තම තමන්ගේ ඒ ඒ බලසීමා ප්‍රදේශ සඳහා ද,

IX. 1991 අංක 29 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත ප්‍රකාරව පළාත් සභා සියලු මන්ත්‍රීවරුන් අදාළ ප්‍රදේශ සඳහාත්, මහා නගර සභාවල හා නගර සභාවල සභායකයන් අදාළ බල ප්‍රදේශ සඳහාත්, ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සෙසු සභායකයන් ද තමන්ගේ අදාළ බල ප්‍රදේශ සඳහාද

නිල බලයෙන් සාමදාන විනිශ්චයකරුවන් ලෙස කටයුතු කරනු ලැබේ.

උප ලේඛණය VII

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වන වගන්තියේ 1(අ) වන උපවගන්තියට අනුව අධිකරණ අමාත්‍යතුමා විසින් සාදන ලද නියෝග අනුව නිල බලයෙන් පත්වන සාම විනිසුරුවරුන්.

අනු අංකය	නිල නාමය	බල ප්‍රදේශය	ගැසට් නිවේදනය
01	විභාග කොමසාරිස්වරු	මුළු දිවයින	2021.05.03 දිනැති හා අංක 2226/12
02	නියෝජ්‍ය විභාග කොමසාරිස්වරු	මුළු දිවයින	2021.05.03 දිනැති හා අංක 2226/12
03	ග්‍රාම නිලධාරි	පත් කර ලැබ සිටින ග්‍රාම නිලධාරි වසම අයත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය	2016.02.18 දිනැති හා අංක 1954/34
04	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි	පත් කර ලැබ සිටින පලාතේ පරිපාලන දිස්ත්‍රික්කය	2023.08.29 දිනැති හා අංක 2347/10
05	ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකරණ නිලධාරි	පත් කර ලැබ සිටින ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය අයත් පරිපාලන දිස්ත්‍රික්කය	2023.08.29 දිනැති හා අංක 2347/10

06	පරිපාලන ග්‍රාම නිලධාරි	මුළු දිවයින	2023.07.04 දිනැති හා අංක 2339/06
07	සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් පත් කරන ලද සමථකාරවරුන්	පත් කර ලැබ සිටින සමථ මණ්ඩල බල ප්‍රාදේශය	2025.06.13 දිනැති හා අංක 2440/27